**ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුලි 25 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 8,162.09 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 7,831.99 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 330.10 ක් හෙවත් සියයට 4.04 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 6,076.09 | 5,988.42 | 87.67 | 1.44 |
| මූලධන | 2,086.00 | 1,843.57 | 242.43 | 11.62 |
| **එකතුව** | **8,162.09** | **7,831.99** | **330.10** | **4.04** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු 04ක් විසින් එකතුව රු.මිලියන 305.95 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 285.71 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 20.24 ක් හෙවත් සියයට 6.62 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 261.76 | 214.54 | 191.76 | 227.94 | 500.00 | 375.17 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 08 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 306.94 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0015/0136/000 | 2.65 |
| 6000/0000/00/0006/0051/000 | 121.66 |
| 6000/0000/00/0002/0010/000 | 5.74 |
| 6000/0000/00/0001/0010/000 | 0.01 |
| 6000/0000/00/0013/0024/000 | 1.04 |
| 6000/0000/00/0018/0011/000 | 9.30 |
| 6000/0000/00/0016/0009/000 | 141.15 |
| 6000/0000/00/0013/0032/000 | 25.39 |
| **එකතුව** | **306.94** |

## 2.4 විගණන නිරීක්ෂණය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

දෙපාර්තමේන්තුව විසින් 2016 පෙබරවාරි 28 දින වනවිට ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ගිණුම් විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, 2016 මැයි 31 දින වන විටත් පහත සඳහන් පරිදි ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| වර්ෂය | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|
| 2006 | 14 |
| 2007 | 14 |
| 2008 | 13 |
| 2009 | 15 |
| 2010 | 22 |
| 2011 | 23 |
| 2012 | 29 |
| 2013 | 41 |
| 2014 | 48 |
| 2015 | 142 |

## 3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය විධිමත් පරිදි යාවත්කාලීන කර පවත්වා නොතිබුණු අතර අනෙකුත් ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | වාහන ලැයිස්තු ගත කිරිමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (iii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (v) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |

**3.3 පොදු තැන්පත් ගිණුම**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 6000/0000/00/0015/0136 දරන පොදු තැන්පත් ගිණුමේ කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ පොත් අනුව 6000/0000/00/0006/0051/000 දරන තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය හා එදිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය අතර රු.651,797 ක වෙනසක් පැවැතුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------

විෂය අංක 28101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.20,491,584 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමඟ සැසඳීමේදී රු.2,623,580 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස තුළ 2007 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ සාරාංශයන්ගේ වෙනස වූ රු.246,528 ක්ද, හඳුනා නොගත් හර ශේෂය රු.2,889,908 ක්ද, හඳුනා නොගත් බැර ශේෂය රු.512,856 ක්ද අන්තර්ගත වී තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තිය ප්‍රකාර කටයුතු නොකළ විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය අවසන් කළ නිලධාරීන්ගේ 2015 දෙසැම්බර් 31 දිනට ණය ශේෂවල එකතුව රු.16,542,960 ක් වී තිබුණි. එම ශේෂ තුළ වර්ෂ 5 ට වඩා වැඩි කාලයක සිට පැවැත එන රු.7,048,802 ක ණය ශේෂයක් විය.

(ඇ) ප්‍රාදේශිය සභාවලට තරඟ කර තේරී පත් වූ මන්ත්‍රීවරු තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.30,740 ක ණය ශේෂයක් ද අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පළාත් සභා නිලධාරින් ලෙස අන්තර්ග්‍රහණය කළ ගොවිජන සේවා නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.486,944 ක ණය ශේෂ වර්ෂ 6 කට වඩා වැඩි කාලයක සිට පැවත එන අතර එම ශේෂයද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගෙන් හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් මාස 03 ක් ඇතුළත නිරවුල් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුවේ වසර 6 කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබු ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ එකතුව රු.3,415,748 ක් වී තිබුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මේ අංශ 06 ක ඉටු කළ යුතු කාර්යයන් ඇතුළත් කර නොතිබුණි.

### 3.5.2 අභ්‍යන්තර විගණනය

ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 3.5.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| මෝටර් වාහන | 09 | වර්ෂ 2 ක සිට වර්ෂ 5ක් දක්වා |
| යන්ත්‍ර සූත්‍ර | 100 | වර්ෂ 2ක සිට වර්ෂ 10 ක් දක්වා |

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් කාර්යාල 02 ක හා ප්‍රධාන කාර්යාලයේ එම වාර්තා 2016 ජුලි 22 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුව සතු වාහන , බුල්ඩෝසර් යන්ත්‍ර පිළිබඳ සමීක්ෂණ මණ්ඩල වාර්තාවක් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2004 ඔක්තෝබර් 14 දිනැති අංක 174 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වත්කම්වලට අදාල සංකේතාංක දක්වා නොතිබුණි.

(iv) දෙපාර්තමේන්තුව සතු රෝද 04 ට්‍රැක්ටර් 72 ක්ද, ට්‍රේලර් 25ක්ද, රෝද 02 ට්‍රැක්ටර් 36 ක්ද හා අනිකුත් කෘෂි උපකරණ 247 ක්ද අපහරණය සඳහා හඳුනාගෙන තිබූ අතර අපහරණ කටයුතු නිම කර නොතිබුණි.

**3.7 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| (අ) **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| (i) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ | | |
| ▪ 14(3) වගන්තිය | 894,831 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 07 ක ආරවුල් පවතින කුඹුරුවල අඳගොවින් විසින් ඉඩම් හිමියන්ට ගෙවීම පිණිස තැන්පත් කර ඇති ඉඩම් හිමි ප්‍රවේණි මුදල් දිසා අධිකරණයේ තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| ▪ 32හා 33 වගන්තිය | | අනවසර කුඹුරු ගොඩකිරීම පිළිබඳ පැමිණිලි 390 ක් ලැබී තිබුණු අතර නඩු පැවරීම් සිදුකර සමථයකට පත්කර තිබූ පැමිණිලි සංඛ්‍යාව 105 ක් විය. |
| ▪ 53(1) වගන්තිය | | කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ ලේඛනයක් පිළියෙල කර සංශෝධනය සහ ප්‍රතිශෝධනය කර පවත්වා නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 396(ඇ) | 2,267,532 | දිස්ත්‍රික් කාර්යාල බැංකු ගිණුම් 14 ක හා ප්‍රධාන කාර්යාල බැංකු ගිණුමෙහි 2015 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට බැංකුවට ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 751(1) | 1,876,370 | නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකකට මිලදී ගත් රු.1,876,370 ක් වටිනා ද්‍රව්‍ය ලේඛනගත කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 756(3) | 2,262,169 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 11 ක හා බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 26 ක වර්ෂ 5 කට වඩා දිර්ඝ කාලයක සිට පැවත එන ප්‍රයෝජනයට ගත නොහැකි /කල් ඉකුත් වූ පොහොර, කෘෂි රසායන, බීජ හා කෘෂි උපකරණ තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 880 | | පුස්සැල්ලාව, මන්දාරම්නුවර, හගුරන්කෙත සහ හරංගල ගොවිජන සේවා මධ්‍යස්ථානවල ප්‍රාදේශීය නිලධාරි, කම්කරු ලිපිකරු හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් ඇප තැන්පත් කර නොතිබුණි. |

(ඇ) **2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන (ගොවි බැංකු) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ චක්‍රලේඛය**

**--------------------------------**

| | | |
|---|---|---|
| (i) | 3.4.2 ඡේදය | කෘෂිකාර්මික ණය පියවීමේ උපරිම කාල සීමාව මාස 6 ක් වුවද, 1998 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලබා දී තිබූ ණයවලින් රු. 215,290,628 ක් හිඟවිටව පැවැතුණි. ඉන් රු.66,188,529 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට හිඟහිටව පැවැත එමින් තිබුණි. |
| (ii) | 4.2 ඡේදය | ගොවි බැංකුවල අත ඉතිරි මුදල් සීමාව උපරිමය ගනුදෙනු අවශ්‍යතාවය හා වාණිජ බැංකු දුර ප්‍රමාණය අනුව රු.25,000 ක් දක්වා තබාගත හැකි වුවත්, එම සීමාව ඉක්මවා ගොවි බැංකු 60 ක මුදල් අත රඳවාගෙන තිබුණි. |
| (iii) | 4.4.2 ඡේදය | ගොවිජන බැංකුවට ලබාදී තිබුණු ප්‍රාග්ධන මුදල් වර්ෂ 5 ක් තුළ ආපසු ගෙවිය යුතු වුවත් 2015 දෙසැම්බර් 31 දිනට ගොවි බැංකු 125 ක් විසින් ආපසු නොගෙවූ හිඟ ප්‍රාග්ධන මුදල රු.48,770,856 ක් වී තිබුණි. |

**3.8 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දමා තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|
| | රු. | | |
| නාගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම | 204,000 | 2015 | ඉඩමේ නීතිමය ගැටළුවක් පැවැතීම |
| අවුලේගම ගොවිජන සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම | 2,730,000 | 2015 | ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමේ ප්‍රමාදය |

**(ආ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

ඇස්තමේන්තුගත පිරිවැය රු.13,542,180 ක් වූ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම සමාලෝචිත වර්ෂය අවසානයේදී නිම කළ යුතු වුවත්, 2015 වර්ෂයේදී රු.2,375,820 ක් වියදම් කර තිබුණද, ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එය නිම කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) **භාණ්ඩ හා සේවා සැපයීමකින් තොරව මුදල් නිදහස් කිරීම**

කොළඹ දිස්ත්‍රික් කාර්යාලයට අමුණු ලෑලි මිලදී ගැනීම සඳහා 2015 දෙසැම්බර් 30 දින රු.1,867,330 ක් වටිනා චෙක්පතක් 2016 මාර්තු 03 දින රාජ්‍ය සංස්ථාවකට ගෙවා තිබූ අතර අදාළ රාජ්‍ය සංස්ථාව විසින් 2016 ජූනි 05 දින වන විටත් එම අමුණු ලෑලි සපයා නොතිබුණි.

**3.9 කාර්යසාධනය**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

නියැදි විගණන පරීක්ෂාවන් අනුව දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ප්‍රධාන කාර්යයන් කිහිපයක් ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i). දිස්ත්‍රික්ක 12 ක් සඳහා පුරන් කුඹුරු ඇස්වැද්දවීමේ වැඩසටහන යටතේ රු.මිලියන 135 ක ප්‍රතිපාදන සලසා තිබුණි. වගාවට යෝග්‍ය කුඹුරු ඉඩම් අක්කර 36476 ක් හඳුනාගෙන තිබුණ අතර ඉන් රු.මිලියන 39 ක් වැය කර අක්කර 3362 ක් පමණක් සංවර්ධනය කර තිබුණි.

(ii). ගොවිජන සේවා මධ්‍යස්ථාන විධිමත් අධික්ෂණය තුළින් ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා පරීක්ෂණ වාර්තා 2736 ක් ලබා ගැනීමට ඉලක්ක ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂණ වාර්තා 737 ක් පමණක් ඉදිරිපත් කර තිබුණි.

(iii). කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩ සටහන සඳහා රු.මිලියන 251.6 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ගොවිජන සේවා මධ්‍යස්ථාන 558 ක් කුඩා කෘෂි උද්‍යාන ලෙස ක්‍රියාකාරකම් 10 ඔස්සේ සංවර්ධනය කිරීමට අපේක්ෂා කළ අතර එහි ප්‍රගතිය සියයට 50 ක මට්ටමක පැවතුණි.

(iv). දිස්ත්රික්ක 09 කට අදාළ අතහැර දමා තිබුණු කුඹුරු අක්කර 850 ක් කාබනික පොහොර යොදා වගාකිරීම සඳහා රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට එහි මුල්‍ය ප්‍රගතිය රු.මිලියන 7.9 ක් විය. ත්‍රිකුණාමලය හා මඩකලපුව දිස්ත්‍රික්කවල භෞතික ඉලක්කය අක්කර 100 ක් වි තිබුණත්, එම ක්‍රියාකාරකම සිදු කර නොතිබුණි.

(v). කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවින් 8000 ක් තෝරා කාබනික පොහොර මෙ.ටො.8000 ක් නිෂ්පාදනයට යොමු කිරීම සඳහා රු. මිලියන 1.7 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එමගින් කාබනික පොහොර මෙ.ටො. 8000 ක් නිෂ්පාදනය කිරීම අපේක්ෂා කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට කාබනික පොහොර නිෂ්පාදනය ආරම්භ කර තිබුණු ගොවින් සංඛ්‍යාව 6815 ක්වූ අතර නිෂ්පාදිත පොහොර ප්‍රමාණය මෙට්රික් ටොන් 5282 ක් වී තිබුණි.

(vi). තෝරාගත් ගොවින් හා නිලධාරීන් 10,000 ක් මාකඳුර ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පුහුණු කිරීම හා පුහුණුව ලැබූවන් මගින් ක්ෂේත්‍රයේ ගොවින් 90,000 ක් පුහුණු කිරීම සඳහා රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වනවිට දි ගොවීන් 4593 දෙනෙක් සහ නිලධාරීන් 2219 දෙනෙක් සඳහා පුහුණුව ලබා දී තිබූ අතර ක්ෂේත්‍රයේ ගොවින් 24860 දෙනෙකු පුහුණු කර තිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

**----------------**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

**-------------------------------------------------------**

ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර නොතිබුණු දිස්ත්‍රික්ක 4 ක සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ද, දිස්ත්‍රික්ක 3 ක පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩ සටහන සඳහාද හා දිස්ත්‍රික්ක 4 ක ඉදිකිරිමේ කටයුතු සඳහාද එකතුව රු.37,320,492 ක් වැය කර තිබුණි.

## 3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### ගැලපුම් කළයුතු ශේෂ

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලැපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | මාස 6 කට වැඩි වර්ෂ 1 කට අඩු | වර්ෂ 1 කට වැඩි වර්ෂ 3 කට අඩු | වර්ෂ 3 කට වැඩි | |
| | | රු. | රු. | රු. | රු. |
| (i) | නිකුත් කළ නමුත් බැංකුවට ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ | 1,209,257 | 1,011,867 | 50,857 | 2,271,981 |
| (ii) | හඳුනා නොගත් හර | 357,042 | 1,131,284 | - | 1,488,326 |
| (iii) | හඳුනානොගත් බැර | 330,292 | 4,200 | - | 334,492 |

## 3.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩ සටහන යටතේ දෙපාර්තමේන්තුව වෙත 281-2-2-12-2502 වැය විෂය යටතේ 2014 වර්ෂයේදී රු.3,500,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාශයේ පිහිටි කෝරලේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෙම ප්‍රතිපාදනය වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබුණු අතර 2016 ජුනි 30 දින වන විට ද එම ප්‍රතිසංස්කරණ කටයුතු නිමකර නොතිබුණි.

## 3.12 අනාර්ථික ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රඹුක්පොත ගොවිජන සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල රු.18,827,083 ක් වැය කර 2009 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. එම ගොඩනැගිල්ල පිහිටි භූමියේ අස්ථාවරත්වය සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉදිරිපත් කළ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම නිසා ගොඩනැගිල්ල ගිලා බැස තිබුණි. 2014 වර්ෂයේදී එම ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) කොළඹ දිස්ත්‍රික් කාර්යාලය විසින් රු. 1,774,650 ක් වැය කර මිලදී ගත් හියුම් පයිප්ප 690 කින් 2016 මැයි 31 දින වන විටද පයිප්ප 597 ක් බෙදා හැරීමෙන් තොරව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ රඳවා ගෙන තිබුණි.

(ඈ) කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය විසින් රු. 2,185,035 ක් වැය කර මිලදී ගත් හියුම් පයිප්ප 200 ක් 2016 ජුනි 30 දින වන විට ද බෙදා හැරීමෙන් තොරව ගොවිජන සේවා මධ්‍යස්ථානවල රඳවා ගෙන තිබුණි.

(ඈ) කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය විසින් රු10,483,839 ක් වැය කර මිලදී ගත් ගෙන තිබුණු සොරොව් දොරටු 160 ක් 2016 ජුනි 30 දින වන විට ද අදාළ කාර්යයයන් සඳහා යොදවා ගෙන නොතිබුණි.

(ඉ) කඩිනම් කාර්යයක් ලෙස සලකා පුවක්ගහකුඹුර සහ පුස්සැලිඔය අමුණු සඳහා අමුණු දොරවල් සැපයීම පිණිස 2015 දෙසැම්බර් 31 දින රු. 1,949,898 ක් ගෙවා තිබුණි. එම අමුණු දොරවල් 2016 අප්‍රේල් 01 දින හා 2016 පෙබරවාරි 20 දින යන දිනවල භාර ගෙන තිබුණි. 2016 ජුනි 03 දින වන විටද එම අමුණු දොරවල් සවිකර නොතිබුණි.

**3.13** පාඩු හා හානි

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුව සතු වාහනයක් 2015 ජනවාරි 27 දින අනතුරකට පත්වී තිබුණි. අනතුර සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවය නිශ්චය කර නොතිබුණි. 2016 ජුලි 20 දින වන විටත් එම වාහනය මාලඹේ අංගනයේ ගාල් කර තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 19 දින අනතුරකට ලක් වි තිබුණු වාහනයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව අලාභය පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව 2014 නොවැම්බර් 20 දින ඉදිරිපත් කර තිබුණි. අලාභය රක්ෂණ සමාගමෙන් අයකර ගතයුතු බව සඳහන් කර තිබුණ ද, 2015 ජුලි 02 දින අළුත්වැඩියාව සඳහා රු.54,700 ක් ගෙවා තිබුණි. 2016 ජුලි 20 දින වන විටත් රක්ෂණ වන්දි ලබා ගෙන නොතිබුණි.

(ඇ) 2015 ජුනි 05 දින අනතුරකට භාජනය වී තිබු දෙපාර්තමේන්තුව සතු වෑන් රථයක් 2016 ජුනි 29 දින රු.1,308,353 ක් වැය කර අළුත්වැඩියා සිදුකර ගෙන තිබූ අතර රක්ෂණ වන්දි වශයෙන් රු.1,263,032 ක් ලැබී තිබුණු බැවින් රු.45,321 ක අලාභයක් සිදුවී තිබුණි.

**3.14** කළමනාකරණ දුර්වලතා

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ව්‍යාජ සහතික ඉදිරිපත් කළ නිලධාරින් 05 දෙනෙකු 2013 මැයි මාසයේදී අනිවාර්ය නිවාඩු යවා 2015 ඔක්තෝබර් 18 දින සේවය අවසන් කර තිබුණි. අනිවාර්ය නිවාඩු යැවූ කාලය හා සේවය අවසන් කළ දිනය අතර සැලකිය යුතු කාලයක් ගතවීම හේතුවෙන් මෙම නිලධාරින්ට රු.3,564,767 ක හිඟ වැටුප් ගෙවා තිබුණි.

(ආ) වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පවතින මූලික විමර්ශන කටයුතු 2016 ජුලි 08 දින (විගණන දින) වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) සිවලාකුලම් ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් රෝද 04 නවතම ට්‍රැක්ටරයක් 2013 ඔක්තෝබර් 05 දින සිට 2014 මාර්තු 07 දින දක්වා කාලපරිච්ඡේදය තුළ ට්‍රැක්ටර් රියදුරුගේ නිවසේ රඳවා තබා ගැනීමට ඉඩ හැර තිබුණි. මෙම කාලපරිච්ඡේදය තුළ කිසිදු ආදායමක් ගොවිජන සේවා මධ්‍යස්ථානයට ලැබී නොතිබුණි. මෙම ට්‍රැක්ටරය 2014 මාර්තු 07 දින මිහින්තලයේ යාන්ත්‍රික ඒකකය වෙත ආපසු භාරදෙන විට ට්‍රැක්ටරයේ ටයර් ගෙවී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) වියලි කළාපීය ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ වී වගාව සඳහා සුදුසු ඉඩම් බවට සකස්කර දීම සඳහා රු.3,221,449 ක් ගොවි සංවිධාන හරහා වවුනියාව දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන කොමසාරිස්වරිය ඉවත්කර ගෙන තිබුණි. මෙම කුඹුරු ඉඩම් සකස්කිරීම අතහැර දමා තිබීම හේතුවෙන් 2015/2016 මහ කන්නයේ කුඹුරු ඉඩම් හිමියන්ට වී වගා කිරීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ඉ) ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය යටතේ ලබා දී තිබූ ණයවලින් 2015 දෙසැම්බර් 31 දිනට හිඟ ණය මුදල රු 249,237,136 ක් වූ අතර එම හිඟහිටි ශේෂය අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතුණි.

## 3.15 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 123 | 70 | 53 |
| (ii) | තෘතියික මට්ටම | 645 | 488 | 157 |
| (iii) | ද්විතියික මට්ටම | 16,066 | 13,329 | 2737 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,543 | 527 | 1,016 |
| | **එකතුව** | **18,377** | **14,414** | **3,963** |

### (ආ) වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 04 දෙනෙක්ද ගොවිජන සංවර්ධන නිලධාරියෙකු ද වෙනත් පාර්ශවයන්ට මුදාහැර තිබුණු බව නිරීක්ෂණය විය.